# මදර් ඉන්දියා



**ඉන්දිය හිටපු ජනාධිපති අබ්දුල් කලාම් මහතා විසින් හයිද්‍රාබාද් හිදී කරන ලද කතාවක සිංහල පරිවර්තනය මෙලෙස ගෙනහැර පාන්නේ, එහි අන්තර්ගතය ඉන්දියාවට පමණක් පොදු නොවූවක් බවත් ඒ හා සැසඳීමේදී බහුතර ශ්‍රී ලාංකික අප සිටින්නේ ද එම මානයේ මැයි හුදෙක් දැනගැනීමටය. . . . . . . .**

ඉන්දියාව පිළිබඳ මා තුළ දැකීම් 3 ක් තිබෙනවා. වසර තුන්දහසක් වූ අප ඉතිහාසය තුළදී මුළුමහත් ලෝකය පුරා විසිරී සිටි විවිධ ජාතීන් පැමිණ අපව ආක්‍රමණය කළා. අපේ ඉඩ කඩම් අත්පත් කර ගත්තා, අපේ මනස යටත් කර ගත්තා. ඇලෙක්සැන්ඩර්ගේ සිට ග්‍රීකවරු, තුර්කීන්, මෝගල්වරු, පෘතුගීසින්, බ්‍රිතාන්‍ය ජාතිකයෝ, ප්‍රංශ ජාතිකයෝ, ලන්දේසීන් සියල්ල පැමිණ අපව කොල්ල කෑවා. අපේ යැයි කියා පැවති දෑ අත්පත් කර ගත්තා. එහෙත් වෙනත් කිසිදු බිමකට, අන්‍ය සංස්කෘතියකට හා අන්‍ය ඉතිහාසයකට අප මෙතෙක් මෙවැනි ආක්‍රමණ සිදු කර නැත. අපේ ජීවන රටාව ඔවුනට බලාහත්කාරයෙන් කාවැද්දීමට තැත් කොට නැහැ. ඒ මක්නිසාද යත් අප අන්‍යන්ගේ නිදහස ගරු කරන නිසා. මෙය මාගේ ප්‍රථම දැක්මයි. එනම් නිදහසයි.

ඉන්දියාව මෙම පළමු දැක්මට අනුගත වූයේ 1857 දී බව මාගේ විශ්වාසයයි. එනම් අප නිදහසේ සටන ආරම්භ කළ අවධියේදීමයි. මෙම නිදහස අප විසින් ආරක්ෂා කොට පෝෂණය කළ යුතුයි. ගොඩ නැංවිය යුතුයි. අප නිදහස් නැත්නම් කිසිවකු අපට ගරු කරන්නේ නැත.

ඉන්දියාව සම්බන්ධ-යෙන් මා තුළ පවත්නා දෙවන දැක්ම සංවර්ධනයයි. වසර 50 ක් මුළුල්ලේ අප තවමත් සංවර්ධන වෙමින් පවතින ජාතියක්. අප විසින් අප සංවර්ධිත ජාතියක් ලෙස දක්නා කාලය දැන් එළඹ තියෙනවා. දළ දේශීය නිෂ්පාදිතය සම්බන්ධයෙන් ගත් කළ අප ලෝකයේ පළමු ජාතීන් 5 අතරට පැමිණිලයි ඉන්නේ. බොහෝ ප්‍රදේශවල 10% ක ආර්ථික වර්ධන වේගයක් අප සතුව තියෙනවා. අපේ දරිද්‍රතා මට්ටම පහත වැටෙමින් තියෙනවා. අපේ ජයග්‍රහණ අද ගෝලීය වශයෙන් පිළිගැනීමට ලක්වෙලා. එහෙත් අපට අපිව සංවර්ධිත ජාතියක් වශයෙන් දැකීමට ආත්ම ශක්තියක් නැහැ. මෙය වැරදි සහගත දැක්මක් නොවන්නේද ?

මා තුළ ඇති තෙවන දැක්ම නම්, ඉන්දියාව ලෝකයට යටත් නොවී සිටිය යුතුයි යන්නයි.මන්ද ඉන්දියාව නැගී නොසිටියහොත් කිසිවෙකු අපට ගරු නොකරන බව මාගේ විශ්වාසයයි. ශක්තිමත් භාවයට ගරු කරනුයේ ශක්තිමත්භාවය පමණි. අප ශක්තිමත් විය යුත්තේ හමුදා බලය අතින් පමණක් නොව ආර්ථිකමය බලය අතින්ද අප ශක්තිමත් විය යුතුය. මේ දෙකම එක්ව ගමන් කළ යුතුයි. ශ්‍රේෂ්ඨ බුද්ධිමතුන් තිදෙනෙකු සමඟ වැඩ කිරීමට ලැබීම මා ලද භාග්‍යයක් සේ මා සලකනවා. ඒ තිදෙනා තමයි අභ්‍යවකාශ දෙපාර්තමේන්තුවේ ආචාර්ය වික්‍රම් සාරාබායි, මහාචාර්ය ෂතිශ් ධවන් හා න්‍යෂ්ඨික ද්‍රව්‍යයන්හි පියා වශයෙන් සැලකෙන ආචාර්ය බ්‍රාහ්ම් ප්‍රකාශ්. ඔවුන් තිදෙනා සමඟ සමීපව කටයුතු කිරීමට මා වාසනාවන්ත වූ අතර මෙය මාගේ ජීවිතේ ලද ශ්‍රේෂ්ඨතම අවස්ථාව ලෙස මම සලකනවා.

මෙහි සිටින මාධ්‍ය මෙතරම් සෘණාත්මක වන්නේ ඇයි ? ඉන්දියාවේ සිටින අපට අපේ ස්වශක්තීන් හා ජයග්‍රහණ පිළිගැනීමට මෙතරම් පැකිලෙන්නේ ඇයි? අප එතරම්ම ශ්‍රේෂ්ඨ ජාතියක්. පුදුම එලවන සුළු සාර්ථකත්වයක් විශාල ප්‍රමාණයක් අප සතුව තිබුණත් ඒවා පිළිගැනීමට අකමැති ඇයි ?

කිරි නිෂ්පාදනයෙන් පළමු තැන සිටින්නේ අපියි. දුරස්ථ සංවේදක චන්ද්‍රිකාවන්ගෙන් මුල් තැන සිටින්නේ අපියි. දෙවන විශාලතම තිරිඟු නිෂ්පාදකයා අපියි. දෙවන විශාලතම සහල් නිෂ්පාදකයා අපියි. ආචාර්ය සුදර්ශන් ගැන බැලුවොත් ඔහු ගෝත්‍රික ගම්මානයක් ස්වෝත්සාහයෙන් නැගිට ඉදිරියට යන ඒකකයක් බවට පත්කොට තියෙනවා. මෙබඳු ජයග්‍රහණ මිලියන ගණනක් ඇති නමුත් අපේ මාධ්‍ය හුවා දක්වා තියෙන්නේ ඉතා නරක ප්‍රවෘත්ති, අසමාර්ථයන් හා ආපදාවන් පමණයි.

වරක් මා ටෙල් අවීව්හි සිටියදී ඊශ්‍රායල් පුවත්පතක් කියවමින් සිටියා. එම දිනය වූයේ ප්‍රහාර හා බෝම්බ හෙලීම් රැසකට අනතුරුව මරණ ගණනාවක් සිදුව තිබූ දිනකට පසු දිනයක්. හමාස් සංවිධානය මගින් පහරදීම් සිදු කොට තිබුණා. නමුත් පුවත්පතෙහි පළමුව තිබුණේ ස්වකීය කාන්තාර බිම වසර ගණනාවක් තුළදී පළතුරු උයනක් හා ධාන්‍යාගාරයක් බවට පත් කොට තිබූ යුදෙව් ජාතික මහත්මයෙකුගේ ඡායාරූපයක්. මෙම අතිවිශිෂ්ට ඡායා රූපය සියළුදෙනා පුදුම කරන්නක් වන්නට ඇතැයි මා සිතනවා. ඝාතන, බෝම්බ හෙලීම්, මරණ, ලේ වැගිරීම් පිළිබඳ විස්තර අනෙකුත් පුවත් අතර ඇතුළු පිටුවල පලවී තිබුණා. ඉන්දියාවේදී අප කියවනුයේ මරණ, ලෙඩරෝග, ත්‍රස්තවාදය, අපරාධ සම්බන්ධයෙන් පමණයි. අප මෙතරම් සෘණාත්මක වන්නේ කුමන හේතුවක් නිසාද ?

මා විසින් හයිද්‍රාබාද් හි දේශණයක් පැවැත්වූ අවස්ථාවක අවුරුදු 14 ක ගැහැණු ළමයෙක් මාගේ සමරු සටහනක් ඉල්ලා සිටියා. ඇයගේ ජීවිතයේ ඉලක්කය කුමක්දැයි විමසූ විට ඇය කියා සිටියේ, මට අවශ්‍ය සංවර්ධනය වූ ඉන්දියාවක ජීවත් වීමටය,

යන්නයි. ඇය වෙනුවෙන් මටත් ඔබටත් සංවර්ධිත ඉන්දියාවක් ගොඩ නැංවීමට සිදුව තිබෙනවා.

ඉන්දියාව ඌණ සංවර්ධිත ජාතියක් නොවන බව ඔබ විසින් අනිවාර්යෙන් කියා සිටිය යුතුයි. එය ඉතා ඉහළ සංවර්ධනයක් අත් කර ගත් රටක්. ඔබේ රට වෙනුවෙන් ඔබ එක මිනිත්තු 10 ක් වැය කර තිබෙනවාද ? ඔබ අපේ රජය අකාර්යක්‍ෂම බව කියනවා. අපේ නීති රීති බොහෝ පැරණි බව කියනවා. නගර සභා විසින් කැලිකසළ රැගෙන නොයන බව කියනවා. දුම්රිය මාර්ග විහිලුවකි. ගුවන් පථ ලොව පවතින නරකම ඒවා වන අතර ලිපි කිසිවිටෙක අදාල ස්ථාන වලට නොලැබෙන බව ඔබ දිගින් දිගටම කියනවා. ඔබ ඒ සම්බන්ධයෙන් කරන්නේ කුමක්ද ?

සිංගප්පූරුවට යන ඔබ වැනි අයෙකු ගැන සිතන්න. ඔබ මාර්ගයන්හි සිගරට් කොට විසි කරන්නේ නහැ. ඔබ ඔවුන්ගේ වටපිටාව පවත්වාගෙන යන ආකාරය පිළිබඳව ආඩම්බරවේ. සවස 5 සිට 8 දක්වා (ඉන්දියාවේ ඕර්චාර්ඩ් පාරෙහි පවතින දුරට සමාන දුරකි) ධාවනය කිරීමට ඔබට ඩොලර් 5 ක් (ආසන්නව රු. 225) ගෙවන්න වෙනවා. ඔබ වාහන නවතා තබා ආපසු පැමිණෙනවිට, ඔබ අවන්හලක හෝ සාප්පුවක වැඩි වේලාවක් නැවතී සිටියහොත් ඔබේ තත්ත්වය නොසලකා වාහනය නවතා තැබීමේ වැඩි ගාස්තුවක් අය කරනවා. නමුත් සිංගප්පූරුවේදී ඔබ කිසිදෙයක් කියන්නේ නැහැ. එහෙම නේද ? රාමසාන් සමයෙ දී ඩුබායිහිදී ප්‍රසිද්ධියේ ආහාර ගැනීමට තරම් ඔබ නිර්භය නොවන බව මා දන්නවා. ජෙඩාහිදී ඔබේ හිස ආවරණය නොකොට පිටත ඇවිද යාමට ඔබ නිර්භය නොවන බව මා දන්නවා. ලන්ඩන් දුරකථන හුවමාරු මධ්‍යස්ථානයක සිටින සේවකයෙකු වෙත කඩා පැනීමට තරම් ඔබ නිර්භය නොවනු බව මා දන්නවා.

වොෂිංටන්හිදී පැයට සැතපුම් 55 කට අධික වේගයකින් රිය පැදවීමටත් ඒ ගැන විමසන රථවාහන පොලිස් නිලධාරියාගෙන් මා කවුද කියා ඔබ දන්නවාද ? යනුවෙන් විමසීමටත් ඔබ නිර්භය නොවන බව මා දන්නවා. ඕස්ට්‍රේලියාවේ හා නවසීලන්තයේ මුහුදු වෙරළබඩ වලදී හිස් පොල්කටු, ඒවා ඉවත් කිරීමට තබා ඇති බඳුන් වලට හැර තැන තැන දැමීමට තරම් ඔබ නිර්භය නොවන බව මා දන්නවා. ඇයි ඔබ ටෝකියෝහි වීදි වලදී අදාළ බඳුන් වලට කෙළ ගසන්නේ ? අප තවමත් කතා කරනුයේ එම ඔබ ගැනමයි. **වෙනත් රටවලදී විදේශ ක්‍රමයකට ගරු කළහැකි ඔබට තම රටේදී එහෙම කරන්න බැරි ඇයි ?**

ඉන්දීය පොලවට පය ගහපු මොහොතේ ඉඳලා එම කඩදාසි කැබලි හා සිගරට් කොට පාරෙහි දමන බව මා දන්නවා. විදේශ රටකදී එහි කටයුතු හා බැඳීමටත් ඒවා ඇගයීමටත් ඔබට හැකි නම්, ඉන්දියාවේදී ඔබට ඒ දෙය කළ නොහැක්කේ ඇයි ?

වරෙක, සම්මුඛ සාකච්ඡාවකදී, බොම්බායෙහි ප්‍රසිද්ධ හිටපු නාගරික කොමසාරිස්වර--යෙකු වූ ටිනයිකර් මහතා කරුණක් සඳහන් කළා. පොහොසත් මිනිසුන් ඔවුන්ගේ සුනඛයින් පාරේ ඇවිද්දවන විට ඔවුන්ගේ මළපහ හිතා මතාම පාරේ තැන තැන ඉතිරි කර යන බව ඔහු කීවා. මෙසේ කරන අයම අකාර්යක්ෂමතාවය හා අපවිත්‍ර පදික වේදිකා සම්බන්ධයෙන් බලධාරීන් විවේචනය කිරීම හා ඔවුනට දොස් පැවරීම සිදු කරනවා. ඔවුන් නිලධාරීන්ගෙන් කුමක් අපේක්ෂා කරයිද ? සුනඛයින් හට මෙලෙස මළපහ කිරීමේ අවශ්‍යතාවය දැණුනු සෑම විටකම ඔවුන් සමඟ යන ඔබ අපද්‍රව්‍ය ඉවත් කිරීමට කොස්සක් ද රැගෙන යන්න. ඇමරිකාවේදී, සෑම සුනඛයෙකුගේම හිමිකාරයෙකුහටම තම සුරතලා මළපහ කළ පසු එම ස්ථාන පිරිසිදු කිරීමට සිදුවෙනවා. ජපානයේද එය එලෙසමයි. ඉන්දීය පුරවැසියෙකු මෙහිදී එවැන්නක් සිදු කරයිද ?

රජයක් තෝරාපත් කර ගැනීමට අප විසින් ඡන්දය ලබා දීලා අනතුරුව සියලු වගකීම් අත්හැර දමනවා. එතැන් සිට සැප පහසුකම් අපේක්ෂාවෙන් අපි විවේකීව බලා ඉන්නවා. අප විසින් දායකත්වයක් නොදක්වමින් සියලු දෑ රජය මඟින් ඉටු කරවා ගැනීමට අපේක්ෂා කරනවා. පිරිසිදු කිරීම් රජයෙන් කර දෙන තුරු අප බලා සිටින නමුත් තැන තැන කුණු කසළ දැමීම අප නවත්වන්නේ නැහැ. තැන තැන විසිරී ඇති කොල කැබැල්ලක් අහුලා, අදාළ කුණු බඳුනට දැමීමට අප උත්සුක වන්නේ නැහැ. දුම්රිය මාර්ග වල පිරිසිදු නාන කාමර අපි අපේක්ෂා කරනවා. නමුත් ඒවා නිසි අකාරයට පරිහරණය කිරීමට අපි ඉගෙන ගෙන තිබෙනවාද ? ඉන්දීය ගුවන් තොටුපලවල හොඳම ආහාර හා වැසිකිළි පහසුකම් අපි අපේක්ෂා කරනවා. නමුත් අපට ලැබෙන සුළු අවස්ථාවේදී හෝ කුඩා කුඩා සොරකම් නොකිරීමට අප සිතනවාද ? මෙය ජනතාවටම සේවය කරන කාර්ය මණ්ඩලයටද අදාල කරුණක්. කාන්තාවන්ට ගැහැණු දරුවන්ට හා අනෙකුත් අයට සම්බන්ධ දෑවැද්ද වැනි දැවෙන සමාජ ගැටළු සම්බන්ධයෙන් ගත් කළ අපි දැවැන්ත උද්ඝෝෂණ වලදී හඬ නඟන නමුත් නිවසේදී එයට විරුද්ධ දෙයම දිගින් දිගට සිදු කරගෙන යනවා. ,වෙනස් විය යුත්තේ සමස්ථ ක්‍රමයයි, එය සාධාරණීකරණය කිරීමට අපි පුරුදු වෙලා ඉන්නවා. රට අභ්‍යන්තරයේ යම් ප්‍රශ්නකාරී අවස්ථා ඇති වුනාම අපි ඇමරිකාවට පලා යනවා. ඒ වාගේම ඔවුන්ගේ ශ්‍රී විභූතිය හා ක්‍රමය වර්ණනා කරනවා. දෑවැද්දට මාගේ පුත්‍රයා හට ඇති අයිතීන් මා පමණක් වැළකීමෙන් ඇති ඵලය කුමක්ද යනුවෙන් ඔබ ප්‍රශ්ණ කරන්නේ නැද්ද ? ඉදින් කවුරුන් විසින් නම් මෙම සමස්ත ක්‍රමය වෙනස් කරයිද ?

පද්ධතියක් සමන්විත වන්නේ කුමකින්ද ? එය අප අසල්වැසියන්ගෙන්, වෙනත් නිවැසියන්ගෙන්, වෙනත් නගරවාසීන්ගෙන් හා රජයෙන් සමන්විත වන බව අපිට ඉතාම පහසුවෙන් ප්‍රකාශ කර සිටින්න පුළුවන්, නමුත් අපි මේ පද්ධතියට සත්‍ය වශයෙන්ම ධනාත්මක දායකත්වයක් සපයනවාද ? නැහැ. එම පද්ධතියට අපගෙන් ඉටුවිය යුතු යුතුකම් පැහැර හරිමින් ඈත දුර පිහිටි රටවල් වලින් පැමිණ අපට සියලු දේ ලබාදේවිය යන යැපුම් මානසිකත්වයෙන් පසු වෙනවා. එසේත් නැත්නම් අපි රට හැර පලායනවා.

නිව්යෝර්ක් නගරය අනාරක්ෂිත වූ කල්හි අප එංගලන්තයට යනවා. එහිදී විරැකියාවට ලක්වූවන් ඊළඟට පලා යන්නේ ගල්ෆ් රාජ්‍යයට. ගල්ෆ්හි යුද්ධය පවතින විට එයින් අපිව මුදවාගෙන ඉන්දියාවට ගෙන්වා ගන්නා ලෙස ඉන්දීය රාජ්‍යයෙන් අයදිනවා. සෑම අයෙකු විසින්ම රට අපරාධයට හා දූෂණයට ලක් කරනවා. පවත්න ක්‍රමය වෙනස් කිරීමට කිසිවෙක් පෙලඹෙන්නේ නැත. අපි අපේ හෘද සාක්ෂිය මුදලට උකස් කොට නැතිද?

*ඩේලි නිවුස් පුවත් පතක මීට වසර 10 කට පෙර පළවූ ලිපියේ මෙම සිංහල පරිවර්තනය එක් කලේ වයාප්ති හා පුහුණු මධ්‍යස්ථානයේ, අතිරේක අධ්‍යක්‍ෂ (වයාප්ති) එන්.පී.සී. ද සිල්වා මහතාය.)*